# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2025.11.17 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2025 ඔක්තෝබර්

**2025 ඔක්තෝබර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 61.0ක අගයක් වාර්තා කළේය.** මෙම වැඩිවීම පුළුල් පදනමක් මත සිදුවූ අතර සියළුම උප දර්ශක මෙම ප්‍රසාරණය සඳහා ධනාත්මක ලෙස දායක විය.

ප්‍රධාන වශයෙන්, ආහාර හා පාන නිෂ්පාදන අංශයට ඉදිරි උත්සව සමය සඳහා නිෂ්පාදන ඇණවුම් ලැබීම හේතුවෙන් නව ඇණවුම් දර්ශකය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එසේම, උත්සව සමය ඉලක්ක කරගත් නිෂ්පාදන කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති බැවින් ඔක්තෝබර් මාසය තුළ දී නිෂ්පාදන උප දර්ශකය ඉහළ ගියේය. තවද, නව ඇනවුම් සහ නිෂ්පාදන කටයුතු ඉහළ යෑමත් සමග සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් උප දර්ශක ද වර්ධනය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඔක්තෝබර් මාසයේ දී ද ඉහළ මට්ටමක පැවතුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **55.4** | **61.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 59.0 | 64.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 55.5 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.0 | 56.0 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 57.5 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 59.0 | 58.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


එළඹෙන උත්සව සමය හා සම්බන්ධව පවතින යහපත් බලාපොරොත්තු පිළිඹිබු කරමින් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු පිලිබඳ අපේක්ෂා ධනාත්මක මට්ටමක පවතියි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**2025 ඔක්තෝබර්**

**61.0**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




**ගෝලීය ප්‍රවණතා**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | පහත වැටීමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 නොවැම්බර් 17 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, පෙර මාසයට සාපේක්ෂව 2025 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 66.0ක අගයක් වාර්තා කළේය.**

2025 ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් වේගවත් වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා විවිධ අංශවල සිදු වූ ශක්තිමත් ක්‍රියාකාරිත්වය හේතු විය. තොග සහ සිල්ලර වෙළඳාම් අංශයෙහි වාර්තා වූ වර්ධනය මෙම ප්‍රසාරණයට හේතු විය. මීට අමතරව, ණය දීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය සේවා හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව වර්ධනය විය. වෙනත් පෞද්ගලික සේවා සහ භාණ්ඩ ප්‍රවාහන හා සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද ඔක්තෝබර් මාසය තුළ ධනාත්මක වර්ධනයට හේතු විය.

ප්‍රධාන වශයෙන් තොග සහ සිල්ලර වෙළඳාම සඳහා වූ ඉහළ ඉල්ලුම සහ මූල්‍ය සේවා යන අංශවල සිදු වූ වර්ධනයත් සමඟ 2025 ඔක්තෝබර් මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

දැනට පවත්නා මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම් කිහිපයක සිදු වූ නව බඳවා ගැනීම් හේතුවෙන් සේවා නියුක්තිය 2025 ඔක්තෝබර් මාසයේ දී පෙර මාසයට වඩා අඩු වේගයකින් ඉහළ ගියේය. කෙසේ වුවද, නිම කිරීමට නියමිත කාර්යයන් සැප්තැම්බර් මාසයේ දී මෙන්ම, සමාන වේගයකින් පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **58.7** | **66.0** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 65.2 | 61.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 53.1 | 52.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිම කිරීමට නියමිත කාර්යයන් | 47.8 | 47.8 | = | සමාන වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 81.1 | 84.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා වූ අපේක්ෂාවන්, යහපත් සාර්ව ආර්ථික තත්ත්වයන්, ඉහළ සංචාරක පැමිණීම්, සහ එළඹෙන උත්සව සමයේ අපේක්ෂිත ඉහළ ඉල්ලුම යන සාධක හේතුවෙන් තවදුරටත් වර්ධනය විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**66.0**

**2025 ඔක්තෝබර්**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් රාජධානිය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 නොවැම්බර් 17 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.